# නර්තනය - 6 ශ්‍රේණිය

(දෙවන වාරය )



The National e-learning Portal for the General Education

නිපුණතා මට්ටම - 3.1.1
ක්‍රියාකාරකම - සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය භාණ්ඩ හඳුනා ගනිමු.

## සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ යනු කුමක්ද ?

❖උඩරට,පහතරට,සබරගමු යන නර්තන සම්ප්‍රදායන් තුනටම ආවේණික වූ වාද්‍ය භාණ්ඩ සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ ලෙස හැඳින්විය හැකිය.

# සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හඳුනා ගැනීම.

ගැටබෙරය



පහතරට බෙරය



දවුල



තම්මැට්ටම



උඩැක්කිය



අත් රබාන



තාලම්පට



හක් ගෙඩිය



පන්තේරුව





හොරණෑව

# වාද්‍ය භාණ්ඩ පිළිබඳ වැදගත් තොරතුරු

1. මෙම වාද්‍ය භාණ්ඩ වාදනය කිරීමේදී එයින් නිපදවෙන අක්ෂර විවිධ වේ.
2. සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ සකස් කිරීමේදී සම්මත ක්‍රම ශිල්ප අනුගමනය කරයි.
3. වාද්‍ය භාණ්ඩ සකස් කිරීමේදී ගන්නා දැව වර්ග, සම් වර්ග, දිග, පළල, පරිමාණයන්, බෙර ඇසේ විෂ්කම්භය නියමිත පරිදි යොදා ගනී.
4. ඉහත ආකාරයට වාද්‍ය භාණ්ඩ සැකසීමේදී එහි ධ්වනි ගුණය රදා පවතී.
5. විශේෂයෙන් වාද්‍ය භාණ්ඩයේ ව්‍යුහය ද මේ සඳහා බලපාන ලබයි.

# සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ වාදනය කරන අවස්තා හඳුනා ගැනීම.

1. දේශීය නර්තන සාම්ප්‍රදායන්වල වාද්‍ය භාණ්ඩ ලෙස යොදා ගනී.එනම්

   උඩරට - ගැටබෙරය

   පහතරට - පහතරට බෙරය

   සබරගමු - දවුල
2. දවුල,තම්මැට්ටම,හොරණෑව යන වාද්‍ය භාණ්ඩ පන්සල්,විහාර,දේවාල වල තේවා හේවිසි ආදි වාදනයේ දී යොදා ගනී.
3. නර්තන සම්ප්‍රදායන් වල නර්තන කිරීමේදී තාල තැබීම සදහා තාලම්පට වාදනය කිරීම.
4. සාම්ප්‍රදායික උඩරට නර්තනයේදී දක්නට ලැබෙන උඩැක්කි නැටුමේදී උඩැක්කිය අතට රැගෙන වාදනය කරමින් නර්තන ඉදිරිපත් කිරීම.
5. තාලම් නැටුමේදී තාලම්පට වාදනය කරමින් නර්තනය ඉදිරිපත් කිරීම.
6. රබන් නැටුමේදී අත් රබාන අතට රැගෙන වාදනය කරමින් නර්තන ඉදිරිපත් කිරීම.
7. ආගමික හා සමාජීය උත්සවයන් වලදී මෙම වාද්‍ය භාණ්ඩ රැගෙන නර්තනය,ගායනය හා වාදනය ඉදිරිපත් කිරීම.

# විකල්ප වාද්‍ය උපකරණ හැඳින ගැනීම

පරිසරයෙන් ලබා ගන්නා ද්‍රව්‍ය හා නිර්මිත ද්‍රව්‍ය භාවිත කරමින් විකල්ප වාද්‍ය උපකරණ නිර්මාණය කළ හැකි වේ.මෙම විකල්ප වාද්‍ය උපකරණ සැකසීමෙදී විවිධ ශිල්ප ක්‍රම තමාගේ දක්ෂතාවය අනුව භාවිත කළ හැකිය.මේ සඳහා විශේෂයෙන්ම අවශ්‍ය වන්නේ නිර්මාණාත්මක චින්තනය යි.මෙසේ නිර්මාණාත්මක චින්තනය ක්‍රියාවට නැංවීම තුළින් මේ විකල්ප වාද්‍ය භාණ්ඩ නිර්මාණය කරගත හැකිවේ.

## විකල්ප වාද්‍ය උපකරණ වලින් හඬ උපදවා ගැනීමට භාවිතා කළ හැකි ක්‍රම ශිල්ප





1) උපකරණයක්/ද්‍රව්‍යයක් එකිනෙකට ඇතිල්ලීම.
2) සෙලවීම
3) තට්ටු කිරීම/තැළීම
4) පිඹීම මගිනි.







| | |
|---|---|
| ටින් එකක් බිම ඇතිල්ලීම<br>1. ටින් පියන්පත් දෙකක් එකට ඇතිල්ලීම.<br>2. ගල් කැට දෙකක් එකට ඇතිල්ලීම.<br>3. යකඩ කැබලි දෙකක් එකට ඇතිල්ලීම.<br>4. රිජිෆෝම් කැබලි දෙකක් එකට ඇතිල්ලීම.<br>5. පොල් කටුවක් මුණින් අතට හරවා බිම ඇතිල්ලීම. | තට්ටු කිරීම/තැළීම<br>1. එක්ස් රේ කොළයකට ලීයකින් තට්ටු කිරීම.<br>2. ලී දෙකක් එකට තට්ටු කිරීම./තැළීම<br>3. ඉරටු ටිකකින් බිමට තැළීම.<br>4. ලී/කාඩ්බෝඩ් පෙට්ටියකට ත්ට්ටු කිරීම.<br>5. ප්ලාස්ටික් කෑන්/බූලි ආදියට ලීයකින් තට්ටු කිරීම. |
| සෙලවීම<br>1. ටින් එකක් හෝ ප්ලාස්ටික් බෝතලයකට ගල් කැට (බොරළු කැට)/ වැලි දමා සෙලවීම.<br>2. පොලිතීන් බෑගයක්/ එක්ස් රේ කොළයක් සෙලවීම.<br>3. ටොනික් පියන් වළල්ලක්( චල් වළල්ලක්)සෙලවීම.<br>4. පොල් ගෙඩියක මදය ඉවත් කර එයට බොරළු කැට කිහිපයක් දමා සෙලවීම. | පිඹීම<br>1. පොල් කොළ/ගොක්කොළවලින් නළා සකසා පිඹීම.<br>2. ගස්ලබු දණ්ඩේ මුල් කෙලවරට හිපියෙක් සවිකර පිඹීම.<br>3. එස්ලෝන් බටයක් ගෙන බටනළාවක් ලෙස සිදුරු විද එය පිඹීම. |

# විකල්ප වාද්‍ය භාණ්ඩ නිර්මාණය කර ගැනීම.

## බෙරය

සාම්ප්‍රදායික බෙරය වෙනුවට සකස් කර ගත හැකි උපකරණ රාශියකි. මේවා විවිධ ආකාරයෙන් සකස්කර ගත හැකිය. ප්ලාස්ටික් බඳුන්/ බිස්කට් ටින් ආදිය යොදාගෙන මේවා සකස්කර ගත හැක. මෙම උපකරණ වල පියන් මතට , පෘෂ්ටයට ලීයක් ගෙන තට්ටු කිරීම, එම ලීයට රෙදිපටියක් ඔතා තට්ටු කිරීම ආදියෙන් හඬ වෙනස් ආකාරයකටද උපදවා ගත හැක. තියුණු හඬක් , ඝෝෂාකාරී හඬක් ආදී ලෙස ශබ්ද උපදවා ගත හැකිය.

## තම්මැට්ටම

බිස්කට් ටින් දෙකක් එකට තබා සම්බන්ධ කර තම්මැට්ටමක් ලෙස යොදා ගත හැකිය. ලී කැබලි දෙකකින් එය වාදනය කරයි.

### දඬු බෙරය


උණ බම්බුවක කැබැල්ලක් ගෙන සාදා ගත හැකිය. මෙම බට කැබල්ලේ දෙපැත්ත සිදුරු වැසී තිබෙන ආකාරයට දෙපැත්ත කපා ගත යුතුය. පෘෂ්ටයේ අඟල් දෙකක පමණ තීරුවක් සිදුරු වන ලෙස දිග අතට කපා අයින් කල යුතුය. බෙරයක ආකාරයට දෙපැත්තට ලණුවක් දමා බෙල්ලේ,ඉණේ රඳවා ගැනීමට සකස් කළ හැක.මෙයට ලී කෝටු දෙකකින් තට්ටු කිරීමෙන් හඬ උපදවා ගත හැකිය.

### ටින් බෙරය

ටින් එකකට හෝ ප්ලාස්ටික් බඳුනක මුහුණත් වලට බැලුන් පටල යොදා බෙරයක් සකසා ගත හැකිය.මෙහි දී බැලුන් පටලය ඇඟිලි දෙකකින් අල්ලා ඇද අත හැරීමෙන් හඬක් උපදවා ගත හැකිය.

### එක්ස් රේ රබාන

රවුම් හෝ හතරැස් ආකාරයට පට්ටමක් යොදාගෙන එක්ස් රේ කොළය හොඳින් ඇද වටේම කුඩා ඇණ ගසා සකසා ගත හැකිය.ලී කෝටු දෙකකින් තට් [illegible] හඬ උපදවා ගත හැකිය.




## විධිමත් ශබ්ද නිපදවිය හැකි භාණ්ඩ

1) හිස් ගම් බෝත්ල් 3 ක් ගෙන එයට විවිධ මට්ටම් වලින් ජලය පුරවන්න.සිසුන් තිදෙනෙකුට මෙය පිඹින්න දීමෙන් විවිධ ශබ්ද නිකුත් වේ.පිඹීම මගින් බෝතලය බුරුල් කිරීම මගින් ද හඬෙහි වෙනසක් ඇති වේ.

2) විවර කරන ලද සැමන් ටින් එකක් හෝ කිරි ටින් එකක් ගන්න.විවෘත නොවූ මුහුණ තෙහි හරි මැදින් කුඩා සිදුරක් විදින්න.එයට තරමක් ලොකු නූලක් දමා අග ගැට ගසා ගන්න.ටින් එක ඇතුළින් එළියට එල්ලෙන නූලට භූමිතෙල් ස්වල්පයක් තවරා එය අතේ ඇඟිලි දෙකකින් අදින්න.එයින් අමුතු ශබ්දයක් නිකුත් වේ.

3) අඟල් ½ කින් යුත් දිග අඩි 2-3 දක්වා වූ බටයක් වතුර භාජනයකට දමා බටය තොල්වලින් තදකර පිඹීමෙන් ශබ්දයක් නිකුත් වේ.




**කාර්‍ය පත්‍රිකාව** 03

1) සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩවල පින්තූර සොයා අභ්‍යාස පොතේ අලවා ඒවායේ නම් ලියන්න. (නැති නම් රූප සටහන් ඇඳ ඒවායේ නම ලියන්න)
2) සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ 4 ක් නම් කරන්න.
3) සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ සැකසීමේ දී එහි ධ්වනි ගුණය රදා පැවැත්මට උපකාර කරගන්නා දේවල් නම් කරන්න.
4) සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ වාදනය කරන අවස්ථා නම් කර ඒ සඳහා භාවිතා කරන වාද්‍ය භාණ්ඩ වෙන වෙනම ලියන්න.
5) විකල්ප වාද්‍ය උපකරණ කෙටියෙන් හඳුන්වන්න.
6) විකල්ප වාද්‍ය උපකරණ 5 ක් නම් කරන්න.එයින් දෙකක් සාදා ගන්නා ආකාරය විස්තර කරන්න.
7) උණ බම්බු කැබැල්ලක්,ලණුවක් යොදා සකසා ගත හැකි වාද්‍ය උපකරණයක රූප සටහනක් අඳින්න.


- **උපදේශකත්වය – එස්. එම්. ඩී. පී .සේනානායක (ස. අ .අ. නර්තන ක. අ. කා. හෝමාගම)**

**සැකසුම - එස් ආර් ආර් ඩබ්.ඩබ්. එම්.පී.කේ. වික්‍රමසූරිය**